පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEADQUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 517
දුරකථනය / தொலைபேசி / Telephone +94 (0) 11 24 21 750, +94 (0) 11 24 21 111 - 9
website: www.police.lk
ෆැක්ස් / தொலைநகல் / Fax +94(0) 11 24 46 174, +94(0) 11 24 40 440
ඊ-මේල් / மின் அஞ்சல் / E-mail igp@police.lk, telligp@police.lk

මගේ අංකය / எனது இல. / My No. Staff DIG/IG/OUT/05/7923/20
ඔබේ අංකය / உமது இல. / Your No
දිනය / திகதி / Date 2020.11.04

## මාධ්‍ය නිවේදනය (සංශෝධනය)

## නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති කාලය තුළ රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අවසර දී ඇති පුද්ගලික ආයතනයක කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම

2020.10.29 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/33/2020 දරණ ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති "ගෝලීය කොරෝනා වෛරස වසංගත තත්ත්වය පවතින අතරතුර දුරස්ථ රාජකාරී කටයුතු ඉටු කිරීමේ වැඩපිළිවෙල" යන චක්‍රලේඛය සහ 2020.10.28 දිනැති අංක 20/2020 දරණ "රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වාගෙන යාම" මැයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් ලබා දී ඇති උපදෙස්වලට යටත් ව රාජ්‍ය සේවයේ අත්‍යවශ්‍ය රාජකාරී කටයුතු නිරෝධායන ඇඳිරි නීතිය පවතින ප්‍රදේශවල ඉටු කිරීම සම්බන්ධව මෙම විධිවිධාන අදාළ වේ.

02. ජනාධිපති ලේකම් විසින් නිකුත් කර ඇති ඉහත චක්‍රලේඛයෙහි ඡේද 01, 02 ඒ, 03 අ i, 03 ඇ, 04 i, 04 ii, 04 vii, 06 අ, 08 සහ 2020.04.18 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/20/2020 දරණ චක්‍රලේඛය හා 2020.05.14 දිනැති අංක PS/GPA/චක්‍රලේඛ/21/2020 දරණ චක්‍රලේඛය කෙරෙහි වැඩිදුරටත් අවධානය යොමු කරවනු ලැබේ.

03. ඒ අනුව රාජ්‍ය / අර්ධ රාජ්‍ය / ව්‍යවස්ථාපිත මණ්ඩල / සංස්ථා සහ පුද්ගලික ආයතන වල සේවකයන් සේවයට කැඳවීම හා සේවයේ යෙදවීම සඳහා නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශවල හා / හෝ ප්‍රදේශ හරහා ගමන් කිරීමට පහත සඳහන් ආයතනවල සේවකයන්ට තම සේවා හැඳුනුම්පත හෝ ජාතික හැඳුනුම්පත සමඟ ආයතන ප්‍රධානියා විසින් නිකුත් කරන ලද සේවයට කැඳවීමේ ලිපියක් ඇඳිරි නීති බලපත්‍ර වෙනුවට භාවිත කළ හැකි බව මෙයින් දැනුම් දෙමි.

04. එබැවින් මෙම ආයතන වල සේවකයන් කැඳවීම හෝ සේවයේ යෙදවීම සඳහා පොලිස් ස්ථාන මඟින් ඇඳිරි නීති බලපත්‍ර නිකුත් නොකරන බව ද දැනුම්දෙනු ලැබේ.

1. ජනාධිපති කාර්යාලය
2. අග්‍රාමාත්‍ය කාර්යාලය
3. සියලු ම කැබිනට් හා රාජ්‍ය අමාත්‍යාංශ
4. නීතිපති දෙපාර්තමේන්තුව
5. අධිවේගී මාර්ග මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ ඒකකය
6. අන්තරායකර ඖෂධ පාලක මණ්ඩලය
7. අපනයන සංවර්ධන මණ්ඩලය
8. අමාත්‍ය මණ්ඩල කාර්යාලය
9. අමාත්‍ය, රාජ්‍ය අමාත්‍ය හා නියෝජ්‍ය අමාත්‍ය කාර්ය මණ්ඩල
10. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව
11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ස්ථාපිත කොමිෂන් සභා
12. ආපදා කළමනාකරණ දෙපාර්තමේන්තුව
13. ආයුර්වේද දෙපාර්තමේන්තුව
14. ආයෝජන මණ්ඩලය
15. ආහාර දෙපාර්තමේන්තුව
16. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
17. ඕෂන්වීව් ඩිවලොප්මන්ට් (පුද්) සමාගම
18. කම්කරු දෙපාර්තමේන්තුව
19. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
20. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
21. කොළඹ කොටස් වෙළඳපොල සහ අනුබද්ධිත ආයතන
22. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
23. ගිනි නිවීම් සේවා දෙපාර්තමේන්තුව
24. ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම
25. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
26. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව
27. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා
28. ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
29. ජාතික ඖෂධ නියාමන අධිකාරිය
30. ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
31. ජාතික ජලජ සම්පත් සංවර්ධන අධිකාරිය (NARDA)
32. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
33. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය
34. ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය
35. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
36. තැපැල් දෙපාර්තමේන්තුව
37. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල
38. දුම්රිය දෙපාර්තමේන්තුව
39. දුරකථන සේවා සැපයුම් ආයතන
40. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
41. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව (DFAR)
42. නාගරික ආයෝජන (පුද්) සමාගම
43. නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය
44. නාගරික සංවර්ධන අධිකාරිය
45. පහත් බිම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය
46. පළාත් ආණ්ඩුකාර කාර්යාලය
47. පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලය
48. පාරිභෝගික සේවා අධිකාරිය
49. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව
50. බන්ධනාගාර දෙපාර්තමේන්තුව
51. මධ්‍යම පරිසර අධිකාරිය
52. මහවැලි අධිකාරිය
53. මාර්ග සංවර්ධන අධිකාරිය
54. මිනුම්දෝරු දෙපාර්තමේන්තුව
55. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව
56. රජයේ කර්මාන්ත ශාලා දෙපාර්තමේන්තුව

57. රජයේ මුද්‍රණාලය
58. රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
59. රාජ්‍ය ඔසුසල
60. රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව
61. රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව
62. රාජ්‍ය හා පෞද්ගලික මූල්‍ය ආයතන
63. ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව
64. ලංකා ගමනාගමන මණ්ඩලය
65. ලංකා ධීවර වරාය සංස්ථාව (CFHC)
66. ලංකා ධීවර සංස්ථාව (CFC)
67. ලංකා නැව් සමාගම
68. ලංකා රෙස්ට්හවුස් (පුද්) සමාගම
69. ලංකා විදුලි (පෞද්) සමාගම
70. ලංකා විදුලිබල මණ්ඩලය
71. ලංකා සතොස ලිමිටඩ්
72. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
73. වනජීවී දෙපාර්තමේන්තුව
74. වාණිජ දෙපාර්තමේන්තුව
75. වාරිමාර්ග දෙපාර්තමේන්තුව
76. වැවිලි අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, මණ්ඩල, සංස්ථා, අධිකාරී හා සමාගම්
77. විභාග දෙපාර්තමේන්තුව
78. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
79. වෝටර්ස් එජ් ආයතනය
80. ශ්‍රී ලංකන් ගුවන් සමාගම
81. ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව
82. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම
83. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
84. ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය
85. ශ්‍රී ලංකා මහබැංකුව
86. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව
87. ශ්‍රී ලංකා රේගුව සහ ආශ්‍රිත සේවා සපයන ආයතන
88. ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ ආශ්‍රිත සේවා සපයන ආයතන
89. සංචාරක මණ්ඩලය
90. සංවර්ධන ලොතරැයි මණ්ඩලය
91. සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
92. සමාජ සේවා දෙපාර්තමේන්තුව
93. සමුද්‍රයීය පරිසර ආරක්ෂණ අධිකාරිය
94. සමූපකාර තොග වෙළෙඳ සංස්ථාව
95. සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
96. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
97. සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය
98. සියලු ම මාධ්‍ය ආයතන
99. සියලු ම පළාත් පාලන ආයතන
100. සියලු ම පෞද්ගලික රෝහල්
101. සියලු ම රක්ෂණ සමාගම්
102. සියලු ම රාජ්‍ය හා පෞද්ගලික බැංකු
103. සියලු ම විදේශ තානාපති කාර්යාල
104. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
105. සී/ස ඛනිජ තෙල් ගබඩා පර්යන්තය
106. සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
107. සී/ස මිල්කෝ පෞද්ගලික සමාගම
108. සුරාබදු දෙපාර්තමේන්තුව
109. සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
110. සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
111. සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
112. මෙම ලැයිස්තුවේ සඳහන් අන්තර් පළාත් ආයතන වලට සමගාමී පළාත් සභා ආයතන

05. මෙම ලැයිස්තුවට ඇතුළත් නොවූව ද යම් අත්‍යවශ්‍ය විශේෂිත කාර්යයක් හෝ ව්‍යාපෘතියක් නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශ තුළ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය බව යම් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ

සංස්ථාවක ප්‍රධානියා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර යම් සේවයකට කැඳවීමට කටයුතු කරන සේවකයන් සඳහා ඉහත විධිවිධාන අදාළ වන අතර, එසේ කැඳවන බව ආයතන ප්‍රධානියා හෝ බලය ලත් නියෝජිතයකු විසින් නිකුත් කරන ලිපියක් මඟින් සනාථ කර තිබිය යුතු ය. එසේ කැඳවීම සම්බන්ධව එම පළාතේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති වෙත ලිඛිතව දැනුම් දී අවශ්‍ය සම්බන්ධීකරණය සිදුකරගත යුතු වේ.

06. රට තුළ Covid 19 වෛරස් රෝග ව්‍යාප්තිය ඉතා කෙටි කාලයකදී අවසන් කර ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇත. එසේ වුව ද ජාතික ආර්ථිකය යහපත් මට්ටමක පවත්වා ගනිමින් මෙම රෝග ව්‍යාප්තිය පාලනය කිරීම සඳහාත් ජනතාවට අවශ්‍ය මූලික සැපයුම් පවත්වාගෙන යාම සඳහාත් නිරෝධායන ඇඳිරි නීතිය පනවා ඇති ප්‍රදේශය තුළ අත්‍යවශ්‍ය රජයේ සහ පුද්ගලික සේවාවන් පවත්වාගෙන යාමට ඉහත පරිදි ඇඳිරි නීති කාලය තුළදී සංචරණය සඳහා සීමිත අවසරයක් ලබාදීම මෙයින් අපේක්ෂා කෙරේ.

සියලුම රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක ප්‍රධානියා හෝ බලයත් නිලධරයකු විසින් සේවකයන් කැඳවීමේදී හා සේවයේ යෙදවීමේදී ඔවුන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව සලකා ඉදිරි දින කිහිපය තුළ ඉතා අත්‍යවශ්‍ය සීමිත හා අවම සේවාවන් ප්‍රමාණයක් පවත්වාගෙන යමින් ඉහත පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවබෝධයෙන් හා නිසි සැලකිල්ලෙන් යුතුව කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙම අවසරය පිළිබඳ අනවබෝධයෙන් හා නොසැලකිල්ලෙන් කටයුතු කරමින් සාමාන්‍ය පරිදි සේවකයන් කැඳවීම හා සේවයේ යෙදවීම තුළින් ඉහත අපේක්ෂාවන් බිඳ වැටෙන බව ද ඒ හේතුවෙන්ම Covid 19 රෝගය පැතිරීම වැඩිවීම සිදුවිය හැකි බව ද එම සේවකයන්ගේ හා ඔවුන්ගේ පවුල්වල අයට බරපතල සෞඛ්‍යමය තර්ජනයක් විය හැකි බව ද ආයතන ප්‍රධානීන් හෝ බලයලත් නිලධරයන් අවබෝධ කරගත යුතු බව අවධාරණය කරනු ලැබේ.

07. යම් රාජ්‍ය / අර්ධ රාජ්‍ය ආයතනයක හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ සංස්ථාවක අධ්‍යක්ෂ මණ්ඩලය හෝ ප්‍රධානියා හෝ බලයලත් නිලධරයකු විසින් ඉහත පරිදි තම සේවකයන් සේවයට කැඳවීම හෝ සේවයේ යෙදවීම සම්බන්ධව ලිඛිතව බලය ලබාදෙන අවස්ථාවක දී අවශ්‍යතාවය නිසි පරිදි තක්සේරු කර නිසි සැලසුමකට අනුව සේවකයන් අවම ප්‍රමාණයක් දෛනිකව සේවයේ යොදවන ආකාරයට කටයුතු කළ යුතු බව ද සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති සෞඛ්‍ය මාර්ගෝපදේශවලට යටත් ව ඔවුන් සේවයේ යොදවන බවට ද එම ලිපි අදාළ සේවකයන් විසින් අවභාවිත නොකරන බවට ද සහතික විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම එම ලිපිය නිකුත් කරන නිලධරයා සතු බව අවධාරණය කරනු ලැබේ.

08. එසේ වුව ද සේවා අවශ්‍යතාවයක් නොමැති ව ඇඳිරි නීති කාලය තුළ තම සේවා හැඳුනුම්පත අවභාවිත කරමින් හෝ ආයතන ප්‍රධානියා හෝ බලයලත් නිලධරයකු විසින් නිකුත් කරන ලද ලිපිය අවභාවිත කරමින් නිරෝධායන රීතිවලට පටහැනිව කටයුතු කරන තැනැත්තන්ට එරෙහිව සහ ඉහත ඡේද 06 හා 07 පරිදි කටයුතු කිරීම පැහැර හරිමින් අදාල ලිපි නිකුත් කිරීම මත Covid 19 රෝගය පැතිරීමට හේතු වී තිබුණහොත් එම ලිපි නිකුත් කළ නිලධරයන්ට එරෙහිව ද නිරෝධායන නීතිය අනුව කටයුතු කිරීමට පියවර ගන්නා බව වැඩිදුරටත් දන්වා සිටිනු ලැබේ.

සී.ඩී. වික්‍රමරත්න
වැඩබලන පොලිස්පති

සී. ඩී. වික්‍රමරත්න
වැඩ බලන පොලිස්පති